නිෂ්පාදන ගිණුම පිළියෙල කිරීම

AAT අදියර I

FAC - මූල්‍ය ගිණුම්කරණය

සංදීප ජයසේකර

MBA (PIM-SJP), B.Sc. (Acct.) Hons. Gold Medal Winner, ACA, SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner, Visiting Lecturer – Colombo University

JMC Jayasekera Management Centre (Pvt) Ltd

Pioneers in Professional Education

65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

JMC vLearning
"your virtual learning partner"

AAT 01 – මූල්‍ය ගිණුම්කරණය

පරිච්ඡේදය - 04
නිෂ්පාදන ගිණුම පිළියෙල කිරීම

Sandeepa Jayasekera

MBA (PIM-SJP), B.Sc. (Acct.) Hons. Gold Medal Winner, FCA, ACCA (UK), SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner, Visiting Lecturer – Colombo University

වෙළඳ ව්‍යාපාර

නිෂ්පාදන ව්‍යාපාර

JMC vLearning "your virtual learning partner"

නිෂ්පාදන ව්‍යාපාර සහ නිෂ්පාදන ගිණුම

- මිලදී ගත් අමුද්‍රව්‍ය, නිෂ්පාදිත ක්‍රියාවලියක් තුල ශ්‍රමය සහ යන්ත්‍රසූත්‍ර භාවිතා කරමින් **නිමි භාණ්ඩ බවට පරිවර්තනය** කිරීමේ නියැළෙන ව්‍යාපාර නිෂ්පාදන ව්‍යාපාර ලෙස සැළකේ.
- නිෂ්පාදන ව්‍යාපාරයක යම් කාලපරිච්ඡේදයක් තුළ නිෂ්පාදනය **සම්පූර්ණ** වූ අයිතමවල **නිෂ්පාදන පිරිවැය** ගණනය කිරීම සඳහා නිෂ්පාදන ගිණුම පිළියෙල කරයි.

Sandeepa Jayasekera - JMC 3

නිෂ්පාදන ක්‍රියාවලිය

යෙදවුම්	ක්‍රියාවලිය	නිමැවුම්
අමුද්‍රව්‍ය	අමුද්‍රව්‍ය නිමි භාණ්ඩ බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය	සම්පූර්ණ කළ නිමි භාණ්ඩ
සෘජු ද්‍රව්‍ය පිරිවැය	සෘජු ශ්‍රම පිරිවැය සෘජු වෙනත් පිරිවැය නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය	නිෂ්පාදන පිරිවැය
අමුද්‍රව්‍ය තොගය	නොනිමි තොගය	නිමි තොගය
අමුද්‍රව්‍ය ගබඩාව	කර්මාන්ත ශාලාව	නිමි තොග ගබඩාව



ප්‍රශ්න අංක 01

ඇඟළුම් නිෂ්පාදන ව්‍යාපාරයකට අදාළව පහත වගුව සම්පූර්ණ කරන්න.

පිරිවැය අයිතමය	සෘජු ද්‍රව්‍ය පිරිවැය	සෘජු ශ්‍රම පිරිවැය	සෘජු වෙනත් පිරිවැය	වක්‍ර ද්‍රව්‍ය පිරිවැය	වක්‍ර ශ්‍රම පිරිවැය	වක්‍ර වෙනත් පිරිවැය

JMC vLearning "your virtual learning partner"

පිරිවැය අයිතමය	සෘජු ද්‍රව්‍ය පිරිවැය	සෘජු ශ්‍රම පිරිවැය	සෘජු වෙනත් පිරිවැය	වක්‍ර ද්‍රව්‍ය පිරිවැය	වක්‍ර ශ්‍රම පිරිවැය	වක්‍ර වෙනත් පිරිවැය

vLearning your learning partner

සෘජු පිරිවැය (ප්‍රාථමික පිරිවැය)

- නිෂ්පාදිතයක් තුළ සෘජුව හඳුනාගත හැකි හෝ නිෂ්පාදිතයකට සෘජුවම අදාළ වන පිරිවැය සෘජු පිරිවැය ලෙස සැලකේ
- සාමාන්‍යයෙන් සෘජු පිරිවැය නිෂ්පාදිත ඒකක ප්‍රමාණය අනුව වෙනස් වෙයි. එනම් නිෂ්පාදිත ඒකක ප්‍රමාණය අඩුවන විට සෘජු පිරිවැය අඩුවේ. ඒකක ප්‍රමාණය වැඩිවන විට සෘජු පිරිවැය වැඩිවෙයි
- සෘජු පිරිවැය සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ සෘජු වෙනත් ලෙස කොටස් තුනකි

උදාහරණ
- ඇඟලුම් කර්මාන්ත ශාලාවක අමු රෙදි සඳහා වැය වූ පිරිවැය
- පොත් මුද්‍රණාලයක මුද්‍රණයන්ත්‍ර ක්‍රියාකරුවන්ට ගෙවන වැටුප

වක්‍ර පිරිවැය (නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය)

- නිෂ්පාදිතයකට අදාළ ඍජුවම හඳුනාගත නොහැකි පිරිවැයක් නිෂ්පාදිත පොදු කාර්ය ලෙස හඳුන්වයි
- මෙම නිෂ්පාදන පොදු කාර්යය ඇතැම් විට නිෂ්පාදිත ඒකක ප්‍රමාණය අනුව විචලනය විය හැකි අතර ඇතැම්විට වෙනස් නොවී ස්ථාවරව පවතී. ඒ අනුව විචල්‍ය නිෂ්පාදන පොදුකාර්යය සහ ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය ලෙස වර්ග දෙකකට බෙදිය හැකිය
- නිෂ්පාදිත පොදුකාර්ය තුළ වක්‍ර ද්‍රව්‍ය, වක්‍ර ශ්‍රමය සහ වක්‍ර වෙනත් පිරිවැයන් ඇතුළත් වේ.

උදාහරණ

- සුපරීක්ෂකගේ වැටුප, කම්හල් විදුලිය, කම්හල් කුලිය, යන්ත්‍ර ක්ෂය

නිෂ්පාදන නොවන පොදුකාර්ය

වක්‍ර පිරිවැය තුළ නිෂ්පාදන පොදුකාර්ය මෙන්ම නිෂ්පාදනනොවන පොදුකාර්ය ඇතුළත් වේ. මෙයින් නිෂ්පාදන පිරිවැයට අදාල වන්නේ නිෂ්පාදන පොදු කාර්යය පමණි. එම නිසා නිෂ්පාදන ගිණුම තුළ නිෂ්පාදන පොදුකාර්ය පමණක් වාර්තා කෙරේ. නිෂ්පාදන නොවන පොදුකාර්ය යනු ව්‍යාපාරයේ පරිපාලන, බෙදාහැරීම්, මූල්‍ය සහ වෙනත් වියදම් වේ. ඒවා ලාභාලාභ ගිණුම තුළ හඳුනා ගනී.

සෘජු ද්‍රව්‍ය පිරිවැය

සෘජු ද්‍රව්‍ය යනු නිෂ්පාදිතය තුළ ඇතුළත් ප්‍රධාන අමුද්‍රව්‍ය වේ.

උදාහරණ

- නිමි ඇඳුම් ව්‍යාපාරයක අමු රෙදි
- බේකරියක පාන් පිටි
- තේ කම්හලක තේ දළු

සෘජු ද්‍රව්‍ය අත්පත් කර ගැනීම හා සම්බන්ධ සමස්ත වියදම සෘජු ද්‍රව්‍ය පිරිවැය ලෙස සැලකේ. සාමාන්‍යයෙන්, සෘජු ද්‍රව්‍ය පිරිවැය නිෂ්පාදන ඒකක ප්‍රමාණය මත වෙනස් වේ.

සෘජු ශ්‍රම පිරිවැය

සෘජු ශ්‍රමය යනු නිෂ්පාදන ක්‍රියාවලිය සමඟ සම්බන්ධ ප්‍රධාන සේවක කණ්ඩායමයි.

උදාහරණ

- ඇඟළුම් ව්‍යාපාරයකට ජුකී මැෂින් ක්‍රියාකරවන්නියන්
- ගෘහ භාණ්ඩ කම්හලක වඩු කාර්මිකයන්
- බේකරියක බේකරිකරුවන්

කර්මාන්තශාලාවේ ප්‍රධාන සේවකයන්ට ගෙවන වැටුප්, අතිකාල EPF, ETF යනාදී සේවක ප්‍රතිලාභ සෘජු ශ්‍රම පිරිවැය ලෙස සැලකේ. සාමාන්‍යයෙන් සෘජු ශ්‍රම පිරිවැය නිෂ්පාදන ඒකක ප්‍රමාණයට අනුව වෙනස් නොවිය හැක. එහෙත් කෑලි ක්‍රමයට ගෙවීම් සිදු කරන්නේ නම් සෘජු ශ්‍රම පිරිවැයට නිෂ්පාදිත ඒකක ප්‍රමාණය අනුව වෙනස් වේ.

සෘජු වෙනත් පිරිවැය

සෘජු ද්‍රව්‍ය හෝ සෘජු ශ්‍රමය නොවන එහෙත් නිෂ්පාදිත ඒකක ප්‍රමාණය අනුව වෙනස් වන වෙනත් වියදම් සෘජු වෙනත් පිරිවැය ලෙස සැලකේ

උදාහරණ

- නිෂ්පාදිත ඒකක මත ගෙවන පුරස්කාර.
- නිෂ්පාදන ඒකක මත මෝස්තර කරුවන්ට ගෙවන ගෙවීම

JMC vLearning "your virtual learning partner"

වක්‍ර ද්‍රව්‍ය පිරිවැය

නිෂ්පාදිතයේ ප්‍රධාන අමුද්‍රව්‍ය නොවන, අනෙකුත් ද්‍රව්‍ය වක්‍ර ද්‍රව්‍ය ලෙස සැලකේ. වක්‍ර ද්‍රව්‍යය අවසාන නිෂ්පාදිතය තුළ දැකීමට හැකි හෝ නොහැකි විය හැකිය.

උදාහරණ

- යන්ත්‍ර ධාවනය සඳහා යොදවන තෙල් සහ ලිහිසි ද්‍රව්‍ය
- බේකරියක පාන් පෝරණුවට භාවිතා කරන දර
- ඇඟළුමක තිබෙන බොත්තම්

බොත්තම් වැනි අයිතම නිෂ්පාදනය තුළ හදුනාගත හැකි සහ අවසන් නිෂ්පාදිතය තුළ ඇතුළත් අයිතමයක් වුවද, එය ප්‍රමාණාත්මක නොවන නිසා නිෂ්පාදන පොදු කාර්යයක් ලෙස සළකයි .

වක්‍ර ද්‍රව්‍ය අත්පත්කර ගැනීමට අදාළ පිරිවැය වක්‍ර ද්‍රව්‍ය පිරිවැය ලෙස සැළකේ.

වක්‍ර ශ්‍රම පිරිවැය

නිෂ්පාදන කටයුත්තෙහි නියැලී සිටින ප්‍රධාන සේවකයින් නොවන එහෙත් නිෂ්පාදන කාර්යයට සහාය වන පාලනය කරන, සුපරීක්ෂණය කරන කළමනාකරණය කරන පිරිස වක්‍ර ශ්‍රමය ලෙස සැලකේ.

උදාහරණ

- නිෂ්පාදන සුපරීක්ෂකවරු
- නිෂ්පාදන කළමනාකරුවන්
- නිෂ්පාදන සහායක සේවකයන්

වක්‍ර ශ්‍රමිකයන්ගේ සේවක ප්‍රතිලාභ පිරිවැය වක්‍ර ශ්‍රම පිරිවැය ලෙස සැලකේ.

JMC vLearning
your virtual learning partner

වක්‍ර වෙනත් පිරිවැය

නිෂ්පාදන කාර්යයට අදාළ වක්‍ර ද්‍රව්‍ය හෝ වක්‍ර ශ්‍රමය නොවන අනෙකුත් සියලූම විචල්‍ය සහ ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය වක්‍ර වෙනත් පිරිවැය ලෙස සැලකේ.

උදාහරණ

- කම්හල් කුලිය
- කම්හල් වරිපනම්
- කම්මල් විදුලිය
- කම්හල් යන්ත්‍ර ක්ෂය

නිෂ්පාදන ව්‍යාපාරයක තිබෙන තොග වර්ග 03 මොනවාද?

JMC vLearn
your virtual learning partner

තොග වර්ග

අමුද්‍රව්‍ය තොග	නොනිමි තොග	නිමි තොග

නොනිමි තොග ගැලපීම්

නොනිමි තොග යනු, වාර්තාකරණ දිනය වන විට තවමත් නිෂ්පාදන ක්‍රියාවලිය තුළ පවතින තොග වේ. වර්ෂය අග පවතින නොනිමි තොගවල නිෂ්පාදන ක්‍රියාවලිය අසම්පූර්ණ නිසා, එහි පිරිවැය නිෂ්පාදන ගිණුමෙන් අඩු කර ජංගම වත්කමක් ලෙස හඳුනාගත යුතු වේ. එමෙන්ම වර්ෂය මුල පැවති නොනිමි තොගය මෙම වර්ෂය තුළ සම්පූර්ණ වන නිසා එය නිෂ්පාදන ගිණුමට එකතු කර තොග වත්කමෙන් ඉවත් කෙරේ.

+ ආරම්භක නොනිමි තොගය	X	
(-) අවසාන නොනිමි තොගය	(X)	X/(X)

26

JMC vLearning
your virtual learning partner

නොනිම් තොග අගය කිරීම ක්‍රම 02කි

- ප්‍රාථමික පිරිවැයට
- මුළු නිෂ්පාදන පිරිවැයට

නොනිම් තොගය ප්‍රාථමික පිරිවැයට ගැලපීම

නොනිම් තොගය තුළ වැඩිපුරම ප්‍රාථමික පිරිවැය තිබේ නම් එය නිෂ්පාදන ගිණුමේ ප්‍රාථමික පිරිවැයට ගලපනු ලැබේ.

නිෂ්පාදන ගිණුමේ උද්ධෘතය

කාලච්ඡේදයේ ප්‍රාථමික පිරිවැය		XX
+ ආරම්භක නොනිම් තොගය	X	
(-) අවසාන නොනිම් තොගය	(X)	X
සම්පූර්ණ කළ අයිතමවල ප්‍රාථමික පිරිවැය		X

JMC vLearning your virtual learning partner

නොනිමි තොගය මුළු නිෂ්පාදන පිරිවැයට ගැලපීම

නොනිමි තොගය තුළට මුළු පිරිවැයෙන් සැළකිය යුතු ප්‍රමාණයක් අවශෝෂණය වී ඇත්නම් එය මුළු පිරිවැයට ගැලපිය යුතුවේ.

නිෂ්පාදන ගිණුමේ උද්ධෘතය

කාලච්ඡේදය සඳහා නිෂ්පාදන පිරිවැය		XX
+ ආරම්භක නොනිමි තොගය	X	
(-) අවසාන නොනිමි තොගය	(X)	X
සම්පූර්ණ වූ අයිතමවල පිරිවැය		X

Sandeepa Jayasekera - JMC

නිෂ්පාදන ගිණුමේ ආකෘතිය

ABC නිෂ්පාදන ව්‍යාපාරය
20x7/3/31 අවසන් වූ වසර සඳහා
නිෂ්පාදන පිරිවැය ලේඛණය

සෘජු ද්‍රව්‍ය පිරිවැය		
+ ආරම්භක අමුද්‍රව්‍ය තොගය	X	
+ අමුද්‍රව්‍ය ගැනුම්	X	
+ ගෙන ඒමේ කුළී	X	
(-) ගැනුම් ආපසු යැවුම්	(X)	
(-) හානි වූ ද්‍රව්‍ය තොගය	(X)	
(-) අවසාන අමුද්‍රව්‍ය තොගය	(X)	
පරිභෝජනය කළ අමුද්‍රව්‍ය පිරිවැය		X
සෘජු ශ්‍රම පිරිවැය		X
සෘජු වෙනත් පිරිවැය		X
ප්‍රාථමික පිරිවැය		XX

30

JMC vLearning
your virtual learning partner

නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය		
කම්හල් විදුලිය	X	
කම්හල් කුලිය සහ වරිපනම්	X	
වක්‍ර ද්‍රව්‍ය පිරිවැය	X	
යන්ත්‍ර ක්ෂය	X	
යන්ත්‍ර නඩත්තු	X	X
කාලච්ඡේදයේ නිෂ්පාදනය පිරිවැය		XX
+ ආරම්භක නොනිමි තොගය	X	
(-) අවසාන නොනිමි තොගය	(X)	X/(X)
නිෂ්පාදන පිරිවැය		XX
නිෂ්පාදන ලාභය		X
වෙළඳ අංශයට යැවූ භාණ්ඩවල හුවමාරු වටිනාකම		XX

31

JMC vLearning
your virtual learning partner

නිෂ්පාදන ගිණුමෙන් වෙළඳ ගිණුමට කරනු ලබන මාරු කිරීම්

නිෂ්පාදන ගිණුම තුල සළකා බලන කාලපරිච්ඡේදයේ සම්පූර්ණ කරන ලද නිෂ්පාදනවල නිෂ්පාදිත පිරිවැය ගණනය කෙරේ. එය වෙළඳ ගිණුමට මාරු කර අවසන් තොග ගලපා විකුණුම් පිරිවැය ගණනය කරනු ලැබේ. නිෂ්පාදනය පිරිවැය වෙළඳ ගිණුමට මාරු කිරීමේදී විකල්ප දෙකක් ඇත.

- නිෂ්පාදන පිරිවැය මාරු කිරීම
- හුවමාරු වටිනාකම මාරු කිරීම (නිෂ්පාදන පිරිවැය කම්හල් ලාභය)

නිෂ්පාදන ගිණුමෙන් වෙළඳ ගිණුමට කරනු ලබන මාරු කිරීම්

නිෂ්පාදන පිරිවැය මාරු කිරීම

නිෂ්පාදන ගිණුමෙන් වෙළඳ ගිණුමට කරනු ලබන මාරු කිරීම්වලදී නිෂ්පාදන පිරිවැය සෘජුවම වෙළඳ ගිණුමට මාරු කළ හැකිය. මෙම ක්‍රමය තුල කම්හල කිසිදු ලාභයක් තබා නොගනී

හුවමාරු වටිනාකම මාරු කිරීම

ඇතැම් විටක කර්මාන්ත ශාලාව වෙළෙඳ ගිණුමට මාරු කරන අයිතම මත යම් ලාභයක් තබා ගනී. එසේ ලාභය ඇතුළත්ව නිෂ්පාදන ගිණුමෙන් වෙළඳ ගිණුමට මාරු කරන වටිනාකම හුවමාරු අගය ලෙස සළකයි.

JMC vLearning "your future learning partner"

නිෂ්පාදන ගිණුමෙන් වෙළඳ ගිණුමට මාරු කිරීම්වලට අදාළ උද්ධෘත

නිෂ්පාදන පිරිවැයට

විකුණුම්		X
විකුණුම් පිරිවැය		
ආරම්භක නිමි තොගය	X	
+ නිෂ්පාදන පිරිවැය	X	
(-) අවසාන නිමි තොගය	(X)	(X)
දළ ලාභය		X

හුවමාරු වටිනාකමට

විකුණුම්		X
විකුණුම් පිරිවැය		
ආරම්භක නිමි තොගය	X	
+ හුවමාරු වටිනාකම	X	
(-) අවසාන නිමි තොගය	(X)	(X)
දළ ලාභය		X
නිෂ්පාදන ලාභය		X
		XX

2024 ජූලි ප්‍රශ්න අංක 03

රිශාද් ඇලුමිනියම්, ඇලුමිනියම් පිරිසැකසුම් නිෂ්පාදකයෙකු වන අතර, පහත සඳහන් තොරතුරු 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රිශාද් ඇලුමිනියම් හි ගිණුම් පොත්වලින් උපුටා ගන්නා ලදි:

විස්තරය	රු.
2023 අප්‍රේල් 01 දිනට අමුද්‍රව්‍ය තොගය	380,000
වර්ෂය තුළදී මිලට ගත් අමුද්‍රව්‍ය	3,600,000
2023 අප්‍රේල් 01 දිනට නොනිමි වැඩ	-
අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුළී	55,000
නිෂ්පාදන සේවකයින්ට ගෙවූ සෘජු වේතන	1,800,000
යන්ත්‍ර නඩත්තුව	120,000
ආරක්ෂක ගාස්තු	450,000
විදුලිය	800,000
කුළිය	570,000
පිරියත සහ යන්ත්‍ර මත ක්ෂය	120,000
මෝටර් ලොරි රථය මත ක්ෂය	360,000

JMC vLearning "your virtual learning partner"

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2023 මාර්තු 31 දිනට පැවති අවසන් තොග පහත පරිදි අගය කරන ලදි:

විස්තරය	රු.
අමුද්‍රව්‍ය තොගය (පිරිවැයට)	150,000
නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කර ඇත)	180,000

(2) පහත සඳහන් වියදම්, පහත දක්වා ඇති පරිදි බෙදා වෙන් කරනු ලැබේ:

වියදම්	කර්මාන්ත ශාලාව	කාර්යාලය
විදුලි වියදම්	75%	25%
කුලිය	70%	30%
ආරක්ෂක ගාස්තු	80%	20%

(3) පිරියත සහ යන්ත්‍ර, ඇලුමිනියම් පිරිසැකසුම් නිෂ්පාදනය සඳහා භාවිත කරන අතර, මෝටර් ලොරිය, නිෂ්පාදනය කරන ලද අයිතම, පාරිභෝගිකයින්ට බෙදා හැරීම සඳහා ව්‍යාපාරය විසින් භාවිත කරනු ලබයි.

(4) නිෂ්පාදනය කරන ලද අයිතම, නිෂ්පාදන පිරිවැය මත 15% ක ලාභයක් සහිතව වෙළෙඳ අංශයට මාරු කරනු ලබයි

ඔබ විසින් කළ යුතු දෑ:

2024 මාර්තු 31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා, රිශාද් ඇළුමිනියම් හි නිෂ්පාදන පිරිවැය ලේඛණය (නිෂ්පාදන ගිණුම) පිළියෙල කරන්න.

(ලකුණු 10)

2024 ජනවාරි ප්‍රශ්න අංක 03

නසීර් මැෂින් වර්ක්ස්, යන්ත්‍ර කොටස් නිෂ්පාදකයෙකු වන අතර, පහත සඳහන් තොරතුරු 2023 මාර්තු 31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා නසීර් මැෂින් වර්ක්ස් හි ගිණුම් පොත්වලින් උපුටා ගන්නා ලදි:

විස්තරය	රු.
2022 අප්‍රේල් 01 දිනට අමුද්‍රව්‍ය තොගය	850,000
අමුද්‍රව්‍ය මිලට ගැනුම්	3,500,000
2022 අප්‍රේල් 01 දිනට නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කරන ලද)	225,000
අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුළී	75,000
සෘජු වේතන - නිෂ්පාදන කම්කරුවන්ට	1,500,000
ආරක්ෂක ගාස්තු	500,000
විදුලි වියදම්	520,000
කර්මාන්තශාලා කළමනාකරුගේ වැටුප	370,000
පිරියත සහ යන්ත්‍ර මත ක්ෂය	320,000
මෝටර් ලොරි රථය මත ක්ෂය	360,000

JMC vLearning "your ideal learning partner"

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2023 මාර්තු 31 දිනට පැවති අවසන් තොග පහත පරිදි අගය කරන ලදි:

විස්තරය	රු.
අමුද්‍රව්‍ය තොගය (පිරිවැයට)	250,000
නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කර ඇත)	425,000

(2) පහත සඳහන් වියදම්, පහත දක්වා ඇති පරිදි බෙදා වෙන් කරනු ලැබේ:

වියදම්	කර්මාන්ත ශාලාව	කාර්යාලය
විදුලි වියදම්	85%	15%
ආරක්ෂක ගාස්තු	90%	10%
ජලය	90%	10%
කුලිය	80%	20%

(3) ව්‍යාපාරය විසින් එහි නිෂ්පාදිත පාරිභෝගිකයන් වෙත බෙදා හැරීම සඳහා ලොරි රථය භාවිත කරනු ලබන අතර, පිරියත සහ යන්ත්‍ර කොන්ක්‍රීට් නිෂ්පාදිත, නිෂ්පාදනය සඳහා භාවිත කරනු ලබයි.

(4) සෘජු වේතන වලට අමතරව, නිෂ්පාදනය කරන සෑම යන්ත්‍ර කොටසකටම රු. 100/- බැගින් වූ දිරි දිමනාවකට නිෂ්පාදන කම්කරුවන් සුදුසුකම් ලබයි. වර්ෂය තුළදී යන්ත්‍ර කොටස් 10,000 ක් නිෂ්පාදනය කර තිබේ.

(5) නිෂ්පාදනය කරන ලද ඒකක, නිෂ්පාදන පිරිවැය මත 20% ක ලාභාන්තිකයක් සහිතව වෙළෙඳ අංශයට මාරු කරනු ලබයි

ඔබ විසින් කළ යුතු දෑ:

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා, නසීර් මැෂින් වර්ක්ස් හි නිෂ්පාදන පිරිවැය ලේඛණය (නිෂ්පාදන ගිණුම) පිළියෙල කරන්න.

(ලකුණු 10)

JMC vLearning "your virtual learning partner"

2023 ජූලි ප්‍රශ්න අංක 03

ශක්ති කොන්ක්‍රීට් වර්ක්ස් යනු කොන්ක්‍රීට් නිෂ්පාදිත නිෂ්පාදකයෙක් වන අතර, පහත සඳහන් තොරතුරු 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශක්ති කොන්ක්‍රීට් වර්ක්ස් හි ගිණුම් පොත්වලින් උපුටා ගන්නා ලදි:

විස්තරය	රු.
2022 අප්‍රේල් 01 දිනට අමුද්‍රව්‍ය තොගය	650,000
අමුද්‍රව්‍ය මිලට ගැනුම්	4,250,000
2022 අප්‍රේල් 01 දිනට නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කරන ලද)	150,000
අමුද්‍රව්‍ය ගෙන ඒමේ වියදම්	25,000
සෘජු වැටුප්	1,200,000
කර්මාන්ත ශාලා කළමනාකරුගේ වැටුප	625,000
කුළිය	300,000
ජලය	50,000
විදුලිය	820,000
යන්ත්‍ර නඩත්තු	105,000
පිරියත සහ යන්ත්‍ර මත ක්ෂය	120,000
මෝටර් ලොරි රථය මත ක්ෂය	220,000

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2023 මාර්තු 31 දිනට පැවති අවසන් තොග පහත පරිදි අගය කරන ලදි:

විස්තරය	රු.
අමුද්‍රව්‍ය තොගය (පිරිවැයට)	585,000
නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කර ඇත)	235,000

(2) ව්‍යාපාරය විසින් එහි නිෂ්පාදිත පාරිභෝගිකයන් වෙත බෙදා හැරීම සඳහා ලොරි රථය භාවිත කරනු ලබන අතර, සියළුම පිරියත සහ යන්ත්‍ර කොන්ක්‍රීට් නිෂ්පාදිත, නිෂ්පාදනය සඳහා භාවිත කරනු ලබයි

(3) පහත වියදම්, පහත දක්වා ඇති පරිදි බෙදා වෙන්කරනු ලැබේ

වියදම්	කර්මාන්ත ශාලාව	කාර්යාලය
විදුලි වියදම්	75%	25%
ජලය	90%	10%
කුලිය	80%	20%

JMC vLearning "your virtual learning partner"

(4) නිෂ්පාදනය කරන ලද ඒකක, නිෂ්පාදන පිරිවැය මත 18% ක ලාභාන්තිකයක් සහිතව වෙළෙඳ අංශයට මාරු කරනු ලබයි

ඔබ විසින් කළ යුතු දෑ:

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා, ශක්ති කොන්ක්‍රීට් වර්ක්ස් හි නිෂ්පාදන පිරිවැය ලේඛණය (නිෂ්පාදන ගිණුම) පිළියෙල කරන්න.

(ලකුණු 10)

2023 ජනවාරි ප්‍රශ්න අංක 03

කළුවර ෆර්නිචර්ස් කෑම මේස සහ පුටු නිෂ්පාදකයෙක් වන අතර, පහත සඳහන් තොරතුරු 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කළුවර ෆර්නිචර්ස් හි පොත්වලින් උපුටා ගන්නා ලදි:

විස්තරය	රු.
2021 අප්‍රේල් 01 දිනට අමුද්‍රව්‍ය තොගය	600,000
අමුද්‍රව්‍ය ගැනුම්	4,700,000
අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලිය	185,000
2021 අප්‍රේල් 01 දිනට නොනිමි වැඩ	නොමැත
කම්හල් කළමනාකරුගේ වැටුප	680,000
සෘජු වේතන	600,000
කුළී	800,000
කම්හල් ගොඩනැගිල්ලේ රක්ෂණය	200,000
විදුලිය	720,000
ජලය	300,000
පිරියත සහ යන්ත්‍ර මත ක්ෂය	350,000
මෝටර් ලොරි රථය මත ක්ෂය	600,000

JMC vLearning "your virtual learning partner"

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2022 මාර්තු 31 දිනට පැවති අවසන් තොග පහත පරිදි අගය කරන ලදි:

විස්තරය	රු.
අමුද්‍රව්‍ය තොගය (පිරිවැයට)	650,000
නොනිමි වැඩ (මුළු නිෂ්පාදනයට අගය කළ)	250,000

(2) පහත වියදම්, පහත දක්වා ඇති පරිදි බෙදා වෙන්කරනු ලැබේ

වියදම්	කර්මාන්ත ශාලාව	කාර්යාලය
විදුලි වියදම්	75%	25%
ජලය	40%	60%
කුලිය	60%	40%

(3) නිෂ්පාදනය කරන ලද ගෘහ භාණ්ඩ, නිෂ්පාදන පිරිවැය මත 25% ක ලාභ ආන්තිකයක් සහිතව වෙළෙඳ අංශයට මාරු කරනු ලබයි.

ඔබ විසින් කළ යුතු දෑ

2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කළුවර ෆර්නිචර්ස් හි නිෂ්පාදන පිරිවැය ලේඛණය (නිෂ්පාදන ගිණුම) පිළියෙල කරන්න

(ලකුණු 10)

JMC vLearning "your virtual learning partner"

2022 ජූලි ප්‍රශ්න අංක 03

ලස්සන පොට්ස්, මල් පොච්චි නිෂ්පාදකයෙකු වන අතර, පහත සඳහන් තොරතුරු 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලස්සන පොට්ස් හි පොත්වලින් උපුටා ගන්නා ලදි:

විස්තරය	රු.
අමුද්‍රව්‍ය මිලට ගැනුම්	3,800,000
අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලී	350,000
කම්හල් කළමනාකරුගේ වැටුප්	420,000
සෘජු වේතන - නිෂ්පාදන කම්කරුවන්	700,000
විදුලිය	620,000
ජලය	400,000
කම්හලේ රක්ෂණය	125,000
ක්ෂය - පිරියත සහ යන්ත්‍ර	250,000
ක්ෂය - මෝටර් ලොරිය	120,000

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) තොග පහත පරිදි අගය කරන ලදි:

විස්තරය	2021 අප්‍රේල් 01 දිනට	2022 මාර්තු 31 දිනට
අමුද්‍රව්‍ය (පිරිවැයට)	800,000	850,000
නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ)	235,000	නොමැත

(2) පහත වියදම්, පහත දක්වා ඇති පරිදි බෙදා වෙන්කරනු ලැබේ

වියදම්	කර්මාන්ත ශාලාව	කාර්යාලය
විදුලි වියදම්	80%	20%
ජලය	90%	10%

(3) මෝටර් ලොරිය භාවිත කරනු ලබන්නේ අමු ද්‍රව්‍ය කම්හලට බෙදා හැරීම සඳහා පමණි.

(4) නිෂ්පාදනය කරනු ලබන සෑම පෝච්චියකටම සෘජු වේතන හැරුණුකොට රු.25/- බැගින් වූ දිරි දීමනාවක් සඳහා කම්හල් කම්කරුවන් හිමිකම් ලබයි. වර්ෂය තුළදී නිෂ්පාදනය කරන ලද මුළු පෝච්චි ගණන 10,000 ක් විය.

(5) නිෂ්පාදනය කරනු ලබන පෝච්චි, නිෂ්පාදන පිරිවැය මත 20% ක ලාභ ආන්තිකයක් සහිතව වෙළෙඳ අංශයට මාරු කරනු ලබයි

ඔබ විසින් කළ යුතු දෑ:

2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලස්සන පොට්ස් හි නිෂ්පාදන පිරිවැය ලේඛණය (නිෂ්පාදන ගිණුම්) පිළියෙල කරන්න.

(ලකුණු 10)

2022 ජනවාරි ප්‍රශ්න අංක 02

රන්සිරි ට්‍රේඩර්ස් තීන්ත නිෂ්පාදකයෙක් වන අතර, පහත සඳහන් තොරතුරු 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රන්සිරි ට්‍රේඩර්ස් හි පොත් වලින් උපුටා ගන්නා ලදි:

විස්තරය	රු.
අමුද්‍රව්‍ය මිලට ගැනුම්	2,771,000
අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලී	29,000
සෘජු වේතන	920,000
රක්ෂණය	328,000
කම්හල් කළමනාකරුගේ වැටුප්	900,000
විදුලිය	420,000
ක්ෂය - පිරියත සහ යන්ත්‍ර	450,000
ක්ෂය - කම්හල් ගොඩනැගිල්ල	180,000

JMC vLearning "your virtual learning partner"

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) තොග පහත පරිදි අගය කරන ලදි:

විස්තරය	2020 අප්‍රේල් 01 දිනට	2021 මාර්තු 31 දිනට
අමුද්‍රව්‍ය	900,000	875,000
නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ)	175,000	420,000

(2) පහත වියදම්, පහත දක්වා ඇති පරිදි බෙදා වෙන්කරනු ලැබේ

වියදම්	කර්මාන්ත ශාලාව	කාර්යාලය
විදුලිය	80%	20%
රක්ෂණය	60%	40%

(3) නිෂ්පාදනය කරනු ලබන පෝච්චි, නිෂ්පාදන පිරිවැය මත 20% ක ලාභ ආන්තිකයක් සහිතව වෙළෙඳ අංශයට මාරු කරනු ලබයි

ඔබ විසින් කළ යුතු දෑ:

2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලස්සන පොට්ස් හි නිෂ්පාදන පිරිවැය ලේඛණය (නිෂ්පාදන ගිණුම්) පිළියෙල කරන්න.

2021 ජූලි ප්‍රශ්න අංක 03

KDI ට්‍රේඩර්ස්, රබර් නිෂ්පාදිත නිෂ්පාදකයෙක් වන අතර, පහත සඳහන් තොරතුරු 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා KDI ට්‍රේඩර්ස් පොත්වලින් උපුටා ගන්නා ලදි:

විස්තරය	රු.
2020 අප්‍රේල් 01 දිනට, අමුද්‍රව්‍ය තොගය	600,000
අමුද්‍රව්‍ය මිලදී ගැනුම්	2,300,000
2020 අප්‍රේල් 01 දිනට නොනිමි වැඩ	350,000
සෘජු වේතන	890,000
විදුලිය	360,000
කම්හල් කළමනාකරුගේ වැටුප	625,000
ජලය	180,000
පිරියත සහ යන්ත්‍රෝපකරණ මත ක්ෂය වීම්	110,000
ගොඩනැගිල්ල මත ක්ෂයවීම	135,000

JMC vLearning "your virtual learning partner"

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2021 මාර්තු 31 දිනට පැවති අවසන් තොග පහත පරිදි අගය කරන ලදි:

විස්තරය	රු.
අමුද්‍රව්‍ය තොගය (පිරිවැයට)	290,000
නොනිමි වැඩ (මුළු නිෂ්පාදනයට අගය කළ)	1,250,000

(2) පහත වියදම්, පහත දක්වා ඇති පරිදි බෙදා වෙන්කරනු ලැබේ

වියදම්	කර්මාන්ත ශාලාව	කාර්යාලය
විදුලිය	90%	10%
ජලය	60%	40%

(3) ගොඩනැගිල්ලේ බිම් ප්‍රමාණයෙන් 90%ක් කම්ලහට අයත් වන අතර, පිරියත සහ යන්ත්‍රෝපකරණ සම්පූර්ණයෙන්ම නිෂ්පාදන ක්‍රියාවලියට යොදවනු ලැබේ

(4) සෘජු වේතන වලට අමතරව, නිෂ්පාදනය කරන සෑම ඒකකයකටම, ඒකකයකට රු.100/- බැගින් වන අමතර දිරි දීමනාවකට නිෂ්පාදන සේවකයන් හිමිකම් ලබයි. වර්ෂය තුළදී නිෂ්පාදනය කළ මුළු ඒකක ගණන 600 කි.

ඔබ විසින් කළ යුතු දෑ:

2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා KDI ට්‍රේඩර්ස් හි නිෂ්පාදන ගිණුම පිළියෙල කරන්න.

(ලකුණු 10)

JMC vLearning "your virtual learning partner"

2021 ජනවාරි ප්‍රශ්න අංක 04

රාමනායක සෙරමික්, සෙරමික් අයිතම නිෂ්පාදනය කරන ආයතනයක් වේ. පහත සඳහන් තොරතුරු 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රාමනායක සෙරමික්හි පොත්වලින් උපුටා ගන්නා ලදි:

විස්තරය	රු.
මිලට ගත් අමුද්‍රව්‍ය	2,100,000
2019 අප්‍රේල් 01 දිනට, අමුද්‍රව්‍ය තොගය	650,000
2019 අප්‍රේල් 01 දිනට, නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ)	910,000
ගෙන ඒමේ කුලී - අමුද්‍රව්‍ය	330,000
සෘජු වේතන	1,650,000
විදුලිය	400,000
කම්හලේ විදුලි ජනක යන්ත්‍රය සඳහා ඉන්ධන	125,000
ලොරි රථය මත ක්ෂය	250,000
ගොඩනැගිලි මත ක්ෂය	160,000
කම්හල් ගොඩනැගිල්ලේ රක්ෂණය	270,000

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2020 මාර්තු 31 දිනට පැවති අවසන් තොග පහත පරිදි අගය කරන ලදි:

විස්තරය	රු.
අමුද්‍රව්‍ය	700,000
නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ)	440,000

(2) පහත වියදම්, පහත දක්වා ඇති පරිදි බෙදා වෙන්කරනු ලැබේ

වියදම්	කර්මාන්ත ශාලාව	කාර්යාලය
විදුලිය	80%	20%
ගොඩනැගිලි මත ක්ෂය	80%	20%
ලොරි රථය මත ක්ෂය	90%	10%

(3) නිෂ්පාදනය කරන ලද භාණ්ඩ පිරිවැය මත 10% ක ලාභයක් සහිතව වෙළෙඳ අංශයට මාරු කරනු ලබයි.

ඔබ විසින් කළ යුතු දෑ:

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රාමනායක සෙරමික්හි නිෂ්පාදන ගිණුම් පිළියෙල කරන්න.

JMC vLearning "your virtual learning partner"

ප්‍රශ්න අංක 02

මිලාන් නිෂ්පාදන ව්‍යාපාරයේ පහත තොරතුරු ඔබට ලබාදී ඇත

20x5/1/1 තොග	
අමුද්‍රව්‍ය	10,400
නොනිමි තොගය	12,600
නිමි තොගය	14,904
අමු ද්‍රව්‍ය මිලදී ගැනීම්	146,200
ගෙන ඒමේ කුළී	3,160
ගෙන යාමේ කුළී	2,790
සෘජු වැටුප්	249,400
වක්‍ර වැටුප්	54,650
කුලිය	49,000

විදුලිය	28,600
ෆොටෝ කොපි	12,600
කාර්යාල වැටුප්	24,780
විකුණුම්	742,490
බොල් ණය	2,484
යන්ත්‍ර සූත්‍ර පිරිවැය	200,000
කාර්යාල උපකරණය පිරිවැය	15,000
මෝටර් රථ පිරිවැය	25,000
ආපහු එවුම්	5,000
ආපසු යැවුම්	2,500
හානි වූ අමුද්‍රව්‍ය	2,000
නිමි තොග ගැනිලි	3,000
ලද වට්ටම්	5,000
දුන් වට්ටම්	4,000
කළමනාකරණ වැටුප්	20,000

JMC vLearning "your virtual learning partner"

පහත අතිරේක තොරතුරු භාවිතා කර නිෂ්පාදන ගිණුම සහ ලාභාලාභ ගිණුම පිළියෙල කරන්න

1. අවසන් තොග පිරිවැය පහත පරිදි වේ

අමු ද්‍රව්‍ය	11,750
නොනිමි තොගය	14,670
නිමි තොගය	15,750

2. වියදම්වලින් අදාළ ප්‍රතිශත පහත දී ඇත

කුලිය	80%
විදුලිය	80%

3. කුලී වියදම තුළ ඉදිරියට ගෙවූ කුලිය රු. 4,000 ඇතුළත් වේ

4. අවසන් මාසයේ විදුලිය රු. 3,500 ගෙවා නොමැත

5. ක්ෂය අනුපාතය පහත පරිදි වේ

යන්ත්‍ර සූත්‍ර	10%
කාර්යාල උපකරණ	15%
මෝටර් රථ	25%

JMC vLearning "your virtual learning partner"